Lesson 24

# මම කිසිම වැරැද්දක් කරලා නැහැ

I haven't done anything wrong

කරලා තියෙන ක්‍රියාවල නැතාර්ථය

මේ පාඩමේදී අපි බලමු "කරලා තියෙනවා " කියන ක්‍රියාවක නැතාර්ථය , ඒ කියන්නේ ඒ ක්‍රියාව "කරලා නැහැ " කියන විදිය . මේක හරිම සරලයි

- ඒ වාක්‍යය වල has ,have වලට නිකම්ම not එකතු වෙනවා . එවිට ඒ ක්‍රියාව කරලා නැහැ කියන අර්ථය එකතු වෙනවා

| | | |
|---|---|---|
| I have gone there<br>අයි හැව් ගෝන් දෙයා(ර්)<br>මම එහෙ ගිහින් තියෙනවා | → | I have not gone there<br>අයි හැව් නොට් ගෝන් දෙයා(ර්)<br>මම එහෙ ගිහින් නැහැ |
| She has come here<br>ෂී හැස් කම් හියර්)<br>ඇය මෙහෙ ඇවිත් තියෙනවා | → | She has not come here<br>ෂී හැස් නොට් කම් හිය(ර්)<br>ඇය මෙහෙ ඇවිත් නැහැ |
| They have finished the work<br>දේ හැව් ෆිනිශ්ඩ් ද ව(ර්)ක්<br>ඔවුන් වැඩේ ඉවර කරලා තියෙනවා | → | They have not finished the work<br>දේ හැව් නොට් ෆිනිශ්ඩ් ද ව(ර්)ක්<br>ඔවුන් වැඩේ ඉවර කරලා නැහැ |

තවත් උදාහරණ බලමු

You have not done it well
යූ හැව් නොට් ඩන් ඉට්(ඩනිට්) වෙල්
ඔයා ඒක හරියට කරලා නැහැ

He has not come back home yet
හී හැස් නොට් කම් බැක් හෝම් යෙට්
ඔහු තාම ගෙදර ඇවිත් නැහැ

We have not seen that film before
වී හැව් නොට් සීන් දැට් ෆිල්ම් බිෆෝ
අපි ඒ චිත්‍රපටිය කලින් දැකලා නැහැ (බලලා නැහැ)

You have not closed the door
යූ හැව් නොට් ක්ලෝස්ඩ් ද ඩෝ
ඔයා දොර වහලා නැහැ

She has not brought flowers
ෂී හැස් නොට් බ්‍රෝට් ෆ්ලව(ර්)ස්
ඇය මල් ගෙනල්ලා නැහැ

They have not sold their house yet
දේ හැව් නොට් සෝල්ඩ් දෙයා(ර්) හවුස් යෙට්
ඔවුන් තාම ඔවුන්ගේ ගේ විකුනලා නැහැ (yet - තවම )

Has not , Have not බොහෝවිට කෙටි කරලා hasn't , haven't ලෙස භාවිතා වෙනවා

They haven't completed the work yet
දේ හැවන්ට් කම්ප්ලීටඩ් ද ව(ර්)ක් යෙට්
ඔවුන් තවම වැඩේ ඉවර කරලා නැහැ

I haven't done it before
අයි හැවන්ට් ඩන් ඉට් බිෆෝ
මම කලින් ඒක කරලා නැහැ

I haven't done anything wrong
අයි හැවන්ට් ඩන් එනිතිං රෝං
මම කිසිම වැරද්දක් කරලා නැහැ

She hasn't traveled alone
ෂී හැස්න්ට් ට්‍රැවල්ඩ් අලෝන්
ඇය තනියෙන් ගමන් බිමන් ගිහින් නැහැ

He hasn't seen the message
හී හැස්න්ට් සීන් ද මැසේජ්
ඔහු පණිවිඩය දැකලා නැහැ

We haven't heard about it
අයි හැව්න්ට් හ(ර්)ඩ් අබවුට් ඉට්
අපි ඒ ගැන අහලා නැහැ

I haven’t seen him before
අයි හැව්න්ට් සීන් හිම් බිෆෝ
මම ඔහුව කලින් දැකලා නැහැ

We haven’t met before
වී හැව්න්ට් මෙට් බිෆෝ
අපි කලින් හමුවෙලා නැහැ

He hasn’t washed his hands.
හී හැස්න්ට් වොෂ්ඩ් හිස් හෑන්ඩ්ස්
ඔහු අත් හෝදලා නැහැ

We haven’t eaten our breakfast yet.
වී හැවන්ට් ඊටන් අව(ර්) බ්‍රෙක්ෆස්ට් යෙට්
අපි තාම උදේට කාලා නැහැ

She hasn’t done her homework
ෂී හැස්න්ට් ඩන් හ(ර්) හෝම්ව(ර්)ක්
ඇය ගෙදර වැඩ කරලා නැහැ

She hasn’t cleaned the room yet.
ෂී හැස්න්ට් ක්ලීන්ඩ් ද රූම් යෙට්
ඇය තාම කාමරය පිරිසිදු කරලා නැහැ

I haven’t attended a party alone.
අයි හැවන්ට් අටෙන්ඩඩ් අ පා(ර්)ටි අලෝන්
මම තනියෙන් පාටියකට ගිහින් නැහැ

I haven’t finished reading the book yet.
අයි හැවන්ට් ෆිනිෂ්ඩ් රීඩිං ද බුක් යෙට්
මම තාම පොත කියවලා ඉවර නැහැ

We haven’t visited our grandparents recently.
වී හැවන්ට් විසිටඩ් අව(ර්) ග්‍රෑන්ඩ්පේරන්ට්ස් රීසන්ට්ලි
අපි මෑතකදී අපේ ආච්චිලා සීයාලා බලන්න ගිහින් නැහැ

He hasn't joined the new class yet.
හී හැස්න්ට් ජොයින්ඩ් ද නිව් ක්ලාස් යෙට්
ඔහු තාම අලුත්  ක්ලාස් එකට එකතු වෙලා නැහැ

එය ඉතාම ලෙහෙසියි . දැන් ඔබට අවශ්‍යය නම් කලින් 22 පාඩමේදී කරලා තිබෙන ක්‍රියා වලට අපි දුන් උදාහරණ වාක්‍යය කිහිපයක් ගෙන ඒවා නැතර්තයට හරවන්න පුළුවන් . ඉන් පසු ඔබේම වාක්‍යය කිහිපයක් ගොඩ නගන්න පුළුවන් . ඒ සදහා උත්සාහ කර බලන්න

Lesson 24

## Spoken English

අපිට තව දුරටත් 'යමක් කරන්න එපා' කියන වාක්‍යය ඛණ්ඩ තවත්  කිහිපයක් දැනකියා ගන්න අවශ්‍යයි. මොකද ඒවා අපිට  එදිනෙදා නිතර පාවිච්චි කරන්න අවශ්‍ය වෙන වැකි නිසා. හොදයි එහෙනම් මේ වාක්‍යය ටිකත් ඔබේ දැනුමට එකතු කරගන්න. අවස්තාව අනුව ඒවාට please කියන වචනය් එකතු කල යුතු බව මතක තබා ගන්න

Don't talk loudly
ඩෝන්ට් ටෝක් ලවුඩ්ලි
හයියෙන් කතා කරන්න එපා

Don't break it
ඩෝන්ට් බ්‍රේක් ඉට්
ඒක  බිදන්න එපා

Don't scribble in the book
ඩෝන්ට් ස්ක්‍රිබල් ඉන් ද බුක්
පොතේ කුරුටු ගාන්න එපා

Don't spit on the floor
ඩෝන්ට් ස්පිට් ඔන් ද ෆ්ලෝ
බිම කෙල ගහන්න එපා

Don't touch others' things
ඩෝන්ට් ටච් අද(ර්)ස් තිංග්ස්
අනිත් අයගෙ දේවලට අත  තියන්න එපා

Don't come late
ඩෝන්ට් කම් ලේට්
පරක්කු  වෙලා එන්න එපා

Don’t tear the paper
ඩෝන්ට් ටියර්) ද පේපර්)
කඩදාසිය ඉරන්න එපා

Don’t stand near the window
ඩෝන්ට් ස්ටෑන්ඩ් නියර්) ද වින්ඩෝ
ජනෙලය අසළ ඉන්න  එපා

Don’t use bad words
ඩෝන්ට් යූස් බැඩ් වර්)ඩ්ස්
නරක වචන කියන්න එපා

Don’t throw papers on the floor
ඩෝන්ට් ත්‍රෝ පේපර්)ස් ඔන් ද ෆ්ලෝ
කඩදාසි බිමට දමන්න එපා

Don’t bring mobile phones
ඩෝන්ට් බ්‍රිං මොබයිල් ෆෝන්ස්
ජංගම දුරකථන ගෙනෙන්න එපා

Don’t be noisy
ඩෝන්ට් බී නොයිසි
ශබ්ද කරන්න එපා

Don’t put your feet on the chair
ඩෝන්ට් පුට් යුවර්)  ෆීට් ඔන් ද චෙයාර්)
පුටුවෙ පාද තියාගන්න එපා

Don’t talk back to the teacher
ඩෝන්ට් ටෝක් බැක් ටු ද ටීචර්)
ගුරුවරයාට එකටෙක කියන්න එපා

Don’t stand on the chair
ඩෝන්ට් ස්ටෑන්ඩ් ඔන් ද චෙයාර්)
පුටුව උඩ  නගින්න  එපා

Don’t pick your nose
ඩෝන්ට් පික් යුවර්) නෝස්
ඔයාගේ නහය හාරන්න එපා

Don’t play with it
ඩෝන්ට් ප්ලේ විත් ඉට්(විතිට්)
ඒකත්  එක්ක සෙල්ලම් කරන්න
එපා

Don’t sit on the floor
ඩෝන්ට් සිට් ඔන් ද ෆ්ලෝ
බිම වාඩිවෙන්න එපා

Don’t be rude
ඩෝන්ට් බී රූඩ්
නපුරු /පරුෂ වෙන්න එපා

Don’t take it away
ඩෝන්ට් ටේක් ඉට්  අවේ
ඒක  අරගෙන යන්න එපා

Don’t remove your shoes
ඩෝන්ට් රිමූව් යුවර්)  ෂූස්
සපත්තු ඉවත් කරන්න එපා

Don’t delay the work
ඩෝන්ට් ඩිලේ ද වර්)ක්
වැඩේ පරක්කු කරන්න එපා

Don’t turn the volume  up
ඩෝන්ට් ට(ර්)න් ද වොලියුම් අප්
සද්දේ වැඩි කරන්න එපා

Don’t work too hard
ඩෝන්ට් ව(ර්)ක්  වූ හාඩ්
ඕනවට වඩා වෙහෙස වෙන්න එපා

Don’t make it dirty
ඩෝන්ට් මේක්  ඉට්  ඩ(ර්)ටි
ඒක  කිලිටි කරන්න එපා

Don’t get discouraged
ඩෝන්ට් ගෙට් ඩිස්කරේජ්ඩ්
අධෛර්යමත්  වෙන්න එපා

Don ‘t  make  me crazy
ඩෝන්ට් මේක්  මී  ක්‍රේසි
මගේ ඔලුව පිස්සු කරන්න එපා

Don’t hurt me
ඩෝන්ට් හ(ර්)ට් මී
මට රිද්දන්න එපා

Don’t force me
ඩෝන්ට් ෆෝස්  මී
මට බල කරන්න එපා

Don ‘t leave leftovers here
ඩෝන්ට් ලීව් ලෙෆ්ට්ඕව(ර්)ස්  හියු(ර්)
කාල ඉතුරුවා මෙතන දාන්න එපා
(leftovers - ලෙෆ්ට්ඕව(ර්)ස් - ඉතිරි වූ කෑම ආදිය )

Don’t talk to your friends during class
ඩෝන්ට් ටෝක් ටු යුව(ර්) ෆ්‍රෙන්ඩ්ස් ඩියුරින් ක්ලාස්
පන්තියේදී යාලුවන්ට කතා කරන්න එපා

Don’t forget to wash your hands
ඩෝන්ට් ෆොගෙට්  ටු වොශ් යුව(ර්)  හෑන්ඩ්ස්
ඔයාගේ අත් හෝදන්න අමතක කරන්න එපා

[ hurt කියන වචනයෙන් ශාරීරිකව රිදවීම හෝ මානසිකව රිදවීම යන අර්ථ දෙකම ගැබ් වෙනවා.ඒ දෙඅර්ථයෙන්ම මෙය භාවිතා කල හැකියි ]
[ rude යන වචනයෙන් සිත් වේදනාවක් ඇති වන ලෙස කතා කිරීම හෝ හැසිරීම අදහස් විය හැකියි.විශේෂයෙන්ම එසේ වන ලෙස වචන පාවිච්චි කිරීම. බොහෝ විට ඉහත යෙදුම යමෙකු කියූ දෙයකට ප්‍රතිචාර ලෙස භාවිත විය හැකිය.]

**Vocabulary 24**

scribble - ස්ක්‍රිබ්ල් - කුරුටු ගානවා

force - ෆෝස් - බල කරනවා

stand - ස්ටෑන්ඩ් - හිටගෙන ඉන්නවා

rude - රූඩ් - පරුෂ / නපුරු / ආචාරශීලී නැති

leftovers - ලෙෆ්ටෝව(ර්)ස් - කෑම කා ඉතුරි වූ දෑ

courage - කරේජ් - ධෛර්යය

join - ජොයින් - එකතු වෙනවා

spit - ස්පිට් - කෙල ගහනවා

tear - ටිය(ර්) - ඉරනවා

tear - ටිය(ර්) - කඳුල

encourage - එන්කරේජ් -  ධෛර්යමත්  කරනවා

discourage - ඩිස්කරේජ් - අධෛර්යමත් කරනවා

crazy - ක්‍රේසි - පිස්සු , (ඇතැම් උදාහරණ වල )කෝපයට පත්

get discouraged - ගෙට් ඩිස්කරේජ්ඩ් - අධෛර්යමත් වෙනවා

kernel - ක(ර්)නල් - ලොඳ (ගෙඩි වල)

trunk - ට්‍රන්ක් - කඳ (ගහක) /අලියාගේ හොඬවැල

garage - ගරාජ් - ගරාජය

tonsils - ටොන්සිල්ස් - සෙම්ගෙඩි

pimples - පිම්පල්ස් - කුරුලෑ

kennel - කෙනල් - බලු කූඩුව

volume - වොලියුම් - ශබ්ද පරිමාණය , ශබ්දයේ ප්‍රමාණය

delay - ඩිලේ - ප්‍රමාදය

talk  back - ටෝක් බැක් - එකටෙක කියනවා

remove - රිමූ - ඉවත් කරනවා

foot - ෆුට් - පය (බහු - feet දෙපය )

Seed - සීඩ් - බීජය, පලතුරක හෝ එළවලුවක ඇටය

Root - රූට් - මූලය

Stem - ස්ටෙම් - පැලෑටියක  කඳ

trunk - ට්‍රංක් - ගහක කඳ

Judge - ජජ් - විනිසුරු

Lawyer - ලෝය(ර්) - නීතිඥයා

Banker - බැංක(ර්) - බැංකු සේවකයා

Pilot - පයිලට් - ගුවන් නියමුවා

Sailor - සේල(ර්) - නාවිකයා

Scientist - සයින්ටිස්ට් - විද්‍යාඥයා

Policeman - පලීස්මන් - පොලිස් නිලධාරියා

Firefighter - ෆය(ර්)ෆයිට(ර්) - ගිනි නිවන භටයා

Guard - ගාඩ් - රැකවලා

Manager - මැනේජ(ර්) - කළමනාකරු